Page 8 October 2010 .qxd 04/10/2010 23:24 Page 1



## කවි කොළය



# බොරුව!

නිලතල, යාන වාහන, දන පිරි වැරුව
ජීවත්වීම සඳහා අතමිට සරුව
බලයේ බලය රැක්මට තහවුරු කෙරුව
නොමියන සදාකාලික ඇත්තකි බොරුව

පවසා වේදිකාවල ගල් පැලෙන බොරු
අපගේ මෝඩකම්වල ඵල නෙළති හොරු
දෙසුවත් අපායක් ගැන හාමුදුරු වරු
පවතී බොරුව ලොව ඉර හඳ තිබෙන තුරු

මැතිවරණයෙහි වැඩියෙන් පව කෙළින කෙනා
පාර්ලිමේන්තු යද්දි මැති අසුන දිනා
ඒ බොරුවලට රැවටුණු බත් බුදින ගොනා
දකිමින් හැබෑ ගොන්නුන්ටත් හතර හිනා!

බොරුකාරයට වැඩ බැරි බව දුටිමි පොතේ
වැඩකාරයට බොරු කෙරුමට නොහැක පුතේ
බොරුවම සදාකල් රජවන ලකුණු ඇතේ
ලොකු ඉල්ලුමකි පැලවෙන බොරුවලට අතේ

බොරුදත්, බොරුකකුල්, බොරුඇස් එමට තිබේ
බොරු සිංහයෝ ගොරවති රජ ඇමති සබේ
බොරු කොණ්ඩයෙන් පණ එයි තට්ටයට ඉබේ
බොරු වැපුරුවොත් පැළවෙයි, ප්‍රතිඵලය ලැබේ

නොහැකිය ඇහැරවනු බොරුවට නිදන එකා
පැවසූ බොරුව බොරුවෙන් ගත හැකිය මකා
බොරුවට කියන මිය යනතුරු ඉඳිමි නොකා
උපවාසය කරති සමහරු හොරට කකා

පන්සිල් රැගෙන පුන්පෝ දා කෙළිති බොරු
බොරුවෙන් නඩු දිනති නීතියෙ ඇදුරු වරු
පාරේ හිඟති හොඳ හැටි පා තිබෙන කොරු
(කෙරුවද සුරා) තහනම් කළ නොහැක බොරු!

සමහරු කියති බොරුවේ ආයුෂ කොටය
වාසිය ලැබෙන්නේ බොරු කී තරම ටය
හැඳගෙන සිටිමු අපි බොරුවේ පිරු වටය
ඇත්තය කියන්නේ බොරුවේ කණ පිටය

චෛතිය රජතුමා
බොරුවේ පියා ය
මිහිකත පලාගෙන
නිරයට ගියා ය
ඔහු මිය ගියත්
පවතී එම න්‍යා ය
සදහට ලොවම
ජයගත් වීරයා ය



♦ තලන්ගම ජයසිංහ
Sri Lanka

# අවවාදයක් නොවේ! සිතන්නට යමකක් !

කතෘට ලියුම්

පසුවුණු අගෝස්තු මාසයේ ලංකාවිත්ති පුවත්පතේ පළ වූ එහි ප්‍රධාන ලිපිය වූ " අපි කන හැටි ලිපා දනී " කියවීමෙන් පසු මෙය ලියන්නට සිතුවෙමි.

ශ්‍රීලංකාවේ ජීවත්වන බොහෝ අය තමන්ට වන සියළු ආපදා-වන්ට කරදරවලට කෙලින්ම බනින්නේ පවතින ආණ්ඩුවටය. එහෙත් එංගලන්තය ඇතුළු යුරෝපයේ රටවල අය එසේ ආණ්ඩුවට නොබැන එයට පිළියමක් සොයාගන්නට මහන්සි ගනිති.

අපේ රටේ ජනතාවට ද අවශ්‍ය නම් එදිනෙදා ගෙදරට අවශ්‍ය එළවළු වවා සාදා ගත හැකි ය. ගම්බද අයට ඉඩකඩ තිබෙන නිසා එළවළු හා බෝග ගෙවත්තේ වගාකරගන්නට පුළුවන. නගරබද අය ද ඉඩ තිබෙන තිබෙන හැටියට ගේ ඇතුළේ හෝ බැල්කනි වල මල් වෙනුවට එළවළු වවාගන්නේ නම් මැනවි. මෑතක මා ලංකාවට ගියවිට බොහෝ ගෙවල්වල පෝච්චි ඇතුළේ ගොටු කොළ ආදී එසේ වගා කළ පළා සහ එළවළු පැළ දැකගත හැකි විය. ඇතැම් අය වැට දිගට කතුරු මුරුංගා, කර පිංචා, රම්පෙ, සේර ආදිය වවා තිබුණෝය. එය ඉතා බුද්ධි මත් ක්‍රියාවක් වන්නා සේම, අනෙක් අයට ද මාහැඟි ආදර්ශයකි.

අද පාන්මිළ වැඩි වී තිබෙන නිසා පාන් වෙනුවට ධාන්‍ය වර්ග, බතල, මඤ්ඤොක්කා, බඩ ඉරිඟු වැනි දෑ කෑමට ගැනීමට මේ සුදුසු කාලයයි. මින් විදේශ විනිමය ඉතුරුවෙනවා පමණක් නොව, එය ශරීර සෞඛ්‍යයටද හිතකරය.

එලෙසම උපන්දින උත්සව වලට යන වියදමෙන් කොටසක් යොදවා කොස් පොල් හා අනෙකුත් පලදාව ඇති ගස් ගෙවත්තේ සිටවාගන්නේ නම් එය එම ළමයින් වෙනුවෙන් හා රටටද කරන මහත් දායාදයක් වන්නේය.

ලෝක යුද්ධයෙන් වැටී සිටි ජර්මණිය, ජපානය වැනි රටවල් ඒ පරාජයන් අභිබවා අද ලෝකයේ දියුණු රටවල් අතුරින් මුල් ස්ථානයන්ට පැමිණ ඇත්තේ ඒ ජනතාවන් මහන්සිය නොබලා රටට ආදරයෙන් පැය 12 ක් 13 ක් වැඩකිරීම නිසයි. එහෙත් අප රටේ කාර්යාලයන්හි අද ඊයේ පමණක් නොව ඒ කාලයේ සිටම වැඩ කෙරෙන හැටි අපි දනිමු. බොහෝ අයගේ වෑයම හැකිතරම් අඩුවෙන් වැඩ කරන්නටය. ප්‍රමාද වී වැඩට එන්නටය. වේලාසනින් නික්ම යන්නටය. එයට තව හේතුවක්ව ඇත්තේ ශ්‍රීලංකාවේ ඇති පක්ෂ දේශ පාලනයයි තම රටටද වැඩකරන ආයතනයටද ආදරයක් ඇතිවීමක් හෝ රටේ ආර්ථිකය නගා සිටුවීම ටද එකාමෙන් නැගී එකමුතුවීමක් හෝ දේශපාලනය බදාගත් අපේ ජනතාව තුළින් හීන වීගොස් ඇති බව පැහැදිලි කරුණකි. එක් දේශපාලන පක්ෂයක් රජයක් පිහිටවූ කල විරුද්ධ පක්ෂයට අයත් වැඩ කරන ජනතාවගේ වැඩ සියල්ල යන්නේ නුහුරු අතටය.

කියුබාවට ආධාර නොදී ඒ රට තනි කළ විට කියුබානුවෝ බොහෝ අත්‍යවශ්‍ය දේ සිය රටේම උපදවා ගන්නට මහන්සි ගත්හ. ඉඩක් නැති අය වහලවල් උඩද එළවළු වැවූහ. කුකුළන්ද ඇතිකරන්නට පටන් ගත්හ. හැකි තරම් අනුනට අත නොපා ජීවත්වීම තවමත් ඔවුන්ගේ අරමුණයි.

එංගලන්තය ඇතුළු බොහෝ යුරෝපීය රටවල බහුතරයක් නිවෙස්වල මෙහෙකරුවන් නැත. සියළු වැඩ කරගන්නේ තමන්ම ය. ගෙදර හා වට පිටාව පිරිසිදු කිරීම්, කැඩුණු බිඳුණු දේ අළුත් වැඩියා කර ගැනීම්, සායම් ගෑම් හා පින්තාරු කිරීම් ආදිය ඒ ගෙවල් වල නිවැසියෝම කර ගනිති. ලංකාවේ වෙසෙන ජනතාවටද මේ සියල්ල අවශ්‍ය නම් තමන්ටම කරගත හැකිය. ගෙවල් දොරවල් හා පරිසරය මනාව පිරිසිදුවට තබාගැන්ම හා කැළිකසල ගොඩ නොගසා ඉවත්කිරීම, කානු හා ජලය ගලායන ස්ථාන සුද්ධකිරීම ආදියෙන් ඩෙංගු හා මැලේරියාව හෝ බරවා වැනි රෝග මර්දනය කරගත හැකි ය. එහෙත් ලංකාවේ අයට ඒ දේවල් කරන්නට අවශ්‍යකමක් තිබේද යන්න සැකයකි. ඩෙංගු වලින් තවමත් අප රටේ මිය යන සංඛ්‍යාව අඩුවක් වී නැත.

බොහෝ යුරෝපීය රටවල ජනතාව රජයම යමක් කරන තෙක් නොසිට ඒ අයම ක්‍රියාශීලීව ප්‍රශ්න විසඳාගන්නට මහන්සි ගනිති. අපේ දේශයේ ජනතාවද එසේ කල්පනාකර කටයුතු කරන්නට කාලය එළඹ තිබේ.

කිසිදාක ජය ගන්නට නොහැකියයි බොහෝ දෙනා අනාවැකි කී දරුණු ත්‍රස්තවාදී යුද්ධයක් ජයගන්නට අපට හැකිවිය. අනෙක් සියළු කරුණු ද සාර්ථකව ජයගන්නට අපට බැරිකමක් නැත. මෙහිදී අවශ්‍ය වන්නේ අපේ ජනතාව උනන්දු කර ඉදිරියට ගෙනයාමට ය. ඔවුන්ට හරිහැටි කරුණු වටහා දුනහොත් අපට නිරවුල් සෞභාග්‍යමත් අනුන්ට අත නොපාන ලංකාවක් ඉදිරියේ දී දක්නට හැකිවෙනවා ඇතැයි මගේ කල්පනාවයි.

♦ මාලා කරුණාරත්න London NW 3

## දේශප්‍රේමියෙකුගෙන් ක්‍රීඩා උපකරණ පරිත්‍යාගයක්

එංගලන්තයේ වෙසෙන ශ්‍රීලාංකිකයෙකු විසින් බාදුරාගොඩ ධර්මාශෝක මහා විද්‍යාලයේ දරු දැරියන්ගේ ප්‍රයෝජනය සඳහා මහා ක්‍රීඩා උපකරණ තොගයක් එම විදුහලටම ගෙනගොස් බාර-දෙනු ලැබීම පසුගියදා සිදුවිය. මෙම දානපතියා ලන්ඩනයේ මිඩ්ල්සෙක්ස් ප්‍රාන්තයේ වයිගර් පාසැලේ දැනට ස්ථාන බාර කළමණාකරු ලෙස සේවය කරන වෙන්නප්පුවේ ස්ටීවන් ප්‍රනාන්දු මහතාය. ඒ මහතාගේ ගම වෙන්නප්පුවය.

ධර්මාශෝක විදුහලේ ක්‍රීඩා උපකරණ පිළිබඳ අඩුලුහුඩුකම් දැන සිටි නැගණහිර කළුවාරිප්පුවේ ජෝශප් මයිකල් බර්නාර්ඩ් මහතා ඒ බව ලන්ඩනයේ වෙසෙන ස්ටීවන් ප්‍රනාන්දු මහතාට දැන්වීම තුළින් මේ අගනා කර්තව්‍ය සිදුවීය. විද්‍යාලයේ ක්‍රීඩා භාර ආචාරිණිය වන ප්‍රියන්ති දයාරත්න මහත්මිය, ක්‍රිකට් පුහුණුකරු එස්. ඒ. අරුණශාන්ත මහතා, නියෝජ්‍ය විදුහල්පති ලක්ෂමන් කුමාරනායක මහතා, විදුහල්පති ඩබ්ලියු. පී. එන්. ඩී. විජේසිංහ මහතාද, ශිෂ්‍ය ශිෂ්‍යාවෝද, ඔවුන්ගේ දෙමාපියෝද ක්‍රීඩා උපකරණ බාරගැන්මේ එම උත්සව අවස්ථාවට සහභාගි වූහ.



**ඉරිදා- SUN** කොළඹ හෝටල්වල සෞඛ්‍ය තත්වය පරීක්ෂා කරන්න පොලිස් කන්ඩායම් දැන් නොදන්වා හදිසියේ කඩා පනිනවා. ඒ වගේ පිටකොටුවෙ එක මුස්ලිම් හෝටලේකට පැන්නම, ඒකෙ කුස්සියෙ වැඩකරන හාදයෙක් නිදිලූ, ගෝදම්බ රොටී ගොඩකට කොට්ටෙ හැටියට ඔළුව තියාගෙන. නැගිට්නව ඕයි කියලා පොලීසියෙන් හෙලෙව්වත් මැන් ඇහැ ඇරිලා නෑ. අනික් පැත්තට හැරිලා, නින්දෙම්ම අර රොටියකින් කෑල්ලක් කඩාගෙන කාලා, ගොරවන්න පටන්ගත්තලූ. පොලීසිය මැන් ඇහැ ඇරවන්න වතුර ජොග්ගුවක් මූණට ගහලා. එතකොට මුදලාලි දුවන් ඇවිත් කිව්වලූ. අනේ රාළහාමි ඔය ගෝදම්බ රොටි ටික නම් තෙමන්න එපා... ඕවා රෑට විකුණන්න තියෙන ඒවා කියලා.. සමහර ගෝදම්බ වල කෙස්ගස් අහුවෙන්නෙ මොකද කියලා දැන් තේරෙනවා.

**සඳුදා- MON** නෙල්සන් ලංකාවෙ ඉඳලා ඇවිත් දැන් අවුරුදු හතළිහකට වැඩිය කියලා එයාගෙ හාමිනේ ගර්ට්-රූඩ් අපිට කිව්වා පෙරේදා පන්සලේදි හම්බ වෙලා. හැබැයි ඒ ආවටම පස්සෙ නෙල්සන් ගිහිං නෑ. අර සමහරුන්ට අහස්යාත්‍රාවල යන්න බය හිතෙන ලෙඩේ එයාටත් හැදිලයි කියලා කිව්වා. ඒකයි මෙච්චර කාලෙකින් ලංකාවට ගිහිං නැත්තෙ. නැවකින් නම් බයනැතුව යන්න ඇහැකිය කිව්වා. මං කිව්වා හම්බන්තොට වරාය හැදුවම නැවෙන් යන්න ඇහැකිය කියලා. කොහොමත් ගම තිස්සමහාරාමෙ නිසා දැන් දෙන්නම බලාගෙන ඉන්නවා එහේ වරාය හදලා ඉවරවෙන කල් ගෙදර ගිහිං එන්න. අපෝ! මිනිස්සුන්ටත් තියන ප්‍රශ්න.

**කුජදා - TUE** ජානකී අද ටෙලිපෝන් කරපු වෙලාවෙ මට කිව්වා සෑහෙන බය හිතෙන කතාවක්. දැන් මෙහේ හදන සේරම ටූත් පේස්ට් වලට මිශ්‍ර කරනවලූ බිම, පොලව හෝදන්න ගන්න මහ විස කෙමිකල් එකක්. ඒකෙ නම කිව්වා සෝඩියම් ලෝරිල් සල්පේට් කියන ජාතිය. ඒ කෙමිකල් එක නිසා දත්මදින කොට හොඳට පෙණ එනවා. දත් හොඳට කිරිපාට වෙනවා. හැබැයි ඒවයෙ විපාක තමයි අවුරුදු දෙකක් යනකොට දත් සේරම වැටෙනවා. මට මතක් වුණා ඒ කාලෙ අපි දත් මැදපු ගෝපාල් දත් බෙහෙත්. අනේ කිසි අගුණයක් නෑ. දත් ටික සේරම පොල් කැල්ල වගේ සුදුවෙනවා. ඒවා හැදුවෙ හෙට්ටිවීදියෙ, මැනුවෙල් නාඩාර් සමාගම. ඒවා තවම තියෙනවද දන්නෙ නෑ. මම කැතරින් කුඩම්මට කියලා යැව්වා ගෝපාල් පැකට් කීපයක් එවන්න කියලා. එතකං මේ බිම හෝදන ඒවයින් මදින්න වෙනවා.

**බුදදා- WED** අද ඉන්දියාවෙ කොමන්වෙල්ත් ක්‍රීඩා තරඟ ආරම්භක උත්සවය බීබීසීයෙන් පෙන්නුවා. ක්‍රීඩා තියෙන ග්‍රවුන්ඩ් එක පෙන්නුවා. ඒ නැටුම් පෙන්නුවා. ෂහ්! කියලා වැඩක් නෑ. පුදුම ලස්සනයි. හැබැයි, දැන් සති දෙකකට ඉස්සෙල්ලා බීබීසී එක පෙන්නුවෙ ඉන්දියාව සවුත්තු කරලා. ඒ හෝටල්වල ඇඳන්වල කිළුටු. ඒ උඩ බල්ලො ලැගලා හිටපු කකුල් පාරවල්. ටොයිලට් වල කැත. මූණ හෝදන බේසමේ තඩි බුලත් කෙළ පාරවල්. අන්තිමට එදා කොටින්ම පෙන්නුවෙ ඉන්දියාව අඩිය තියන්න නොහිතෙන මහ අපිරිසිදු රටක් හැටියට. අද බී බී සී අයම කියනවා ඉන්දියාවෙ වැඩවල ලස්සන. අන්න එහෙමයි ඉන්දියාව සයිස් එක පෙන්නුවෙ, බලන ඇයො හොල්මන් වෙන්න. ඒක අපටත් ආඩම්බරයක් !

**ගුරුදා - THU** හුඟ කාලෙකට පස්සෙ අද මතුගම සෝමතුංග බාප්පට කතාකෙරුව. ඒ වෙලාවෙ දැනගත්තෙ සෝමතුංග බාප්ප දැන් බුලත් කෑම නවත්තලා බව. මං කිව්වා හරි ෂෝක්ය කියලා. බාප්ප මේ මෑතක පිළිකා රෝගය ගැන පොත් වගයක් කියෙව්වයින් පස්සෙ තමයි ඒක වෙලා තියෙන්නෙ. කුඩම්මා කොච්චර කිව්වද එපා ය කියලා. ඒත් බාප්ප බුලත් කෑවා. ඒ විතරක් නෙවෙයි, දැන් ලංකාවෙ අළුත් පරම්පරාව කිසි කෙනෙක් බුලත් විඩ කන්නෙ නැහැයි කියනවා. ඒක කොච්චර එකක්ද? ලංකාවෙ වැවෙන බුලත්, පුවක්, සේරම දැන් පකිස්ථානෙටයි, ඉන්දියාවටයි යවනවා කියලා පත්තරේක තිබුණා. පුවක් ගෙඩියක් දැන් රුපියල් අටලු. හිතන්න පුළුවන්ද, සතේට තිබුණු පුවක් රුපියල් අටක් වුනයි කිව්වම ?

**කිවිදා - FRI** මේකත් මේ බුලත් කතාවක් තමයි. ගිය සතියෙ අපි වෙම්බ්ලි වලින් **83** බස් එක ගත්තා ඇල්පර්ටන් වලට යන්න. වෙම්බ්ලි හයි රෝඩ් එකේ ගිහිං බස් එක ඊළිං පාරට හරවන්න කලින් හෝල්ට්එකේ නැවැත්තුවම දැක්කෙ එතන බෝඩ් එකක බ්‍රෙන්ට් කවුන්සිල් එකෙන් ගහපු විශාල පෝස්ටර් එකක්. **Do not eat pan and spit. Fine £200**.(බුලත් කාලා කෙළගහන්න එපා! දඩය පවුම් 200 යි) ඒ පෝස්ටර් බ්‍රෙන්ට් ප්‍රාන්තයේ බහුතර ඉන්දියානු ජනතාවට කරන ඇමතීමක් ! ඒ පෝස්ටර් ගැහුව කියලා ඉන්දියන්කාරයින්ට ගාණක් නෑ. තව ටිකක් එහාට යනකොට ඊළිං රෝඩ් එකේම එළවළු කඩ තියන හරියෙ බාක්ලේ බැංකුව ළඟ තඩි බුලත් කෙළ පාරවල් ගොඩක්. ඒ බිත්තිවල හිටන්. ඒ එතන **Cash Point** එකෙන් සල්ලි ගන්න ගමන් ඉන්දියන් කස්ටිය ගහපු ඒවා. කවදාවත් ඒ ගොල්ලො හදන්න බෑ.